# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2496/24 – 2026 ජූලි මස 08 වැනි බදාදා – 2026.07.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ ,මාතැටිල්ල (67 ජේ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොන්තහෙල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක B/BND/2014/809 හා 2015.07.21 වන දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්: (හෙක්. 0.0157):

01. කැබලි අක්ෂර ‘A’ - ගල්ගොඩ උහනේ ඇල්පිටවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0157

උතුරට : මාතැටිල්ල ඔය සහ වේරගොඩ මසාච්චි සුනිල් හිමිකම් කියන ගල්ගොඩ උහනේ ඇල් පිටවත්ත ;නැගෙනහිරට: වේරගොඩ මසාච්චි සුනිල් හිමිකම් කියන ගල්ගොඩ උහනේ ඇල් පිටවත්ත සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය);දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ වේරගොඩ මසාච්චි සුනිල් හිමිකම් කියන ගල්ගොඩ උහනේ ඇල්පිටවත්ත; බටහිරට:වේරගොඩ මසාච්චි සුනිල් හිමිකම් කියන ගල්ගොඩ උහනේ ඇල්පිටවත්ත සහ මාතැටිල්ල ඔය.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

*මගේ අංකය*: 4-3/5/2013/HW/486.
2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 – 0120